*සැ. යු.* - 2025.10.10 දින පළ කරන ලද අංක 2458 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,459 - 2025 ඔක්තෝබර් මස 17 වැනි සිකුරාදා - 2025.10.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 264 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 නොවැම්බර් මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ඔක්තෝබර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනෑන්ස් කම්පැණි පීඑල්සී,
අංක 84, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

නඩු අංකය : DMB/45/22
ඇස්කිසි අංකය : 04/2024
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 8,887,021/55

*..........පැමිණිලිකරු.*

*- එදිරිව -*

කෙහෙල් බද්දරගේ නීල් ප්‍රියන්ත පෙරේරා,
අංක 121, හෙල්විශියාවත්ත, 4 පටුමග,
නාරම්මල.

*............විත්තිකරු.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2023.06.28 වැනි දින ඇතුළත් කරන ලද සමථය පරිදි විත්තිකරු විසින් එකී සමථය කඩ කර ඇති බැවින්, සමථ තීන්දු ප්‍රකාශය පරිදි,

(*අ*) වර්ෂ 2021.12.20 දිනට රුපියල් අසූ අට ලක්ෂ අසූ හත් දහස් විසි එකයි ශත පනස් පහක (රු. 8,887,021.55) මුදල සහ ඒ මත වර්ෂ 2021.12.21 දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වනතුරු ඒ මත මාසික පොළිය ද සහ ව්‍යවස්ථාපිත ගාස්තු ද සමග අයකර දෙන ලෙසත්,

(*ආ*) මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරන සියලුම දේපළ හා ඊට අයත් සියලුම ගොඩනැගිලි, සවිකිරීම්, මාර්ග අයිතිවාසිකම්, සහ එකී ඉඩමට හා පරිශ්‍රයට අයත් සියලුම අනුබද්ධ සහ එකී ඉඩම සහ අනුබද්ධ සහ එකී ඉඩම හා පරිශ්‍රය මතින් හෝ තුළින් විත්තිකරුවන්ට සියලුම අනුබද්ධ සහ එකී ඉඩම සහ පරිශ්‍රය මතින් හෝ තුළින් විත්තිකරුවන්ට ඇති කවරාකාරයක හෝ ඉල්ලීම් සියල්ල ඉහත කී ණය ආපසු අයකර ගැනීම සඳහා බැඳෙන බවට සහ ක්‍රියාත්මක කළ හැකි බවට ප්‍රකාශ කරන ලෙසත්,

(*ඇ*) තීන්දු ප්‍රකාශිත ඉහත කී මුදල්, පොළී, නඩු ගාස්තු සහ ව්‍යාස්ථාපිත ගාස්තු ද සමග තීන්දු ප්‍රකාශ දිනයේ සිට මාස දෙකක් ඇතුළත ගෙවීම පැහැර හැරියහොත්, රජයේ *ගැසට්* පත්‍රයේ සහ අවම වශයෙන් දේශීය පුවත්පත් දෙකක නිසි පරිදි ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව අධිකරණය විසින් පත් කරනු ඇති වෙන්දේසිකරුවෙකු මාර්ගයෙන්, මෙහි පහත උපලේඛනයේ විස්තර කෙරෙන ඉඩම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසත් සහ එම ප්‍රසිද්ධ කිරීම මගින් පැ.4 වශයෙන් ලකුණු කරන ලද උකස්කරය මත ප්‍රමාණවත් යැයි වෙන්දේසිකරු විසින් සළකනු ලබන විකුණුම් කොන්දේසි අධිකරණය විසින් අනුමත කරන ලෙසත් සහ පහත සඳහන් දෑ කිරීම සඳහා එකී වෙන්දේසිකරුට නියෝග කරන ලෙසත්,

(i) සංශෝධිත 1949 අංක 06 දරන උකස් පනතේ 52(1) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි මෙහි පහත උපලේඛනයෙහි විස්තර කර ඇති එකී ඉඩම හා පරිශ්‍රය පළමුව වර්තමාන වෙළඳපළේ වටිනාකමට විකිණීම සඳහා තබන ලෙසත් සහ එම අවස්ථාවේ ලංසු තබන්නන් නොමැතිනම්, තීන්දු ප්‍රකාශය යටතේ අයවිය යුතු මුදල වශයෙන් දැන්වීමේ නියම කරන ලද මිල කරන ලද වටිනාකමට විකිණීම සඳහා තබන ලෙසත් සහ එම විකිණීමේ දී ලංසු තබන්නන් නොමැතිනම් ඉන් අනතුරුව වැඩිම ලංසුවට විකිණීමට තබන ලෙසත්,

(ii) මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති උකස් කරන ලද එකී දේපළ සඳහා ලංසු තැබීමට සහ මිල දී ගැනීමට පැමිණිලිකරුට හෝ පැමිණිලිකරු වෙනුවෙන් වෙනත් ඕනෑම අයෙකුට ඉඩ ලබා දෙන ලෙසත් සහ පැමිණිලිකරු ගැණුම්කරුවන අවස්ථාවක දී එහි හිමිකම් පෑමේ සහ පිරිවැයේ ප්‍රමාණයට බැර සැලසීම සඳහා එයට ඉඩ ලබා දෙන ලෙසත්,

(*ඈ*) එවැනි විකිණීමක දී විකිණීමේ කොන්දේසි නිසි ලෙස සපුරා ඇති බවට සහ සෑහීමට පත්වීමෙන් අනතුරුව ගැණුම්කරුගේ වාසියට නිසි පැවරීමේ ඔප්පුවක් මගින් අවශ්‍ය පැවරීම් සිදු කිරීමට ද, වෙන්දේසිකරුට හෝ අධිකරණය විසින් බලය පවරන වෙනත් ඕනෑම තැනැත්තෙකුට නියම කරන ලෙසත්,

(ඉ) මෙහි උපලේඛනයෙහි විස්තර කරන ඉඩමෙහි සහ පරිශ්‍රයෙහි හිස් භුක්තිය ගැණුම්කරුවෙකුට බාර දෙන ලෙස අධිකරණයේ පිස්කල්වරයාට නියම කරන ලෙසත්,

(ඊ) නඩු ගාස්තු ලබා දෙන ලෙසත්,

එකී සමථය පරිදි ගෙවිය යුතු රුපියල් 8,785,000/- මුදලින් මේ වනවිට රුපියල් 660,000/- ක මුදලක් විත්තිකරු විසින් ගෙවා ඇත. ඒ අනුව එම සමථය පරිදි විත්තිකරු විසින් එකී සමථය කඩ කර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2025ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින පෙ. ව. 10.30 ට,**

ඉහත නම් සඳහන් විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුකහ කෝරළේ - උතුර දඹදෙනි හත්පත්තුවේ නාරම්මල ප්‍රාදේශීය සභා සහ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නාරම්මල - 1065 ග්‍රාම නිලධාරි වසම තුළ දෙමටගහවෙල ගම පිහිටි "හෙල්විටිය වත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සාදන ලද අංක 66/91 සහ 1991.05.31 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 121 දරන ඉඩමට මායිම් උතුරට : ලොට් 45 (පාර) සහ එම පිඹුරේම ලොට් 122 ද, නැගෙනහිර සහ දකුණු - නැගෙනහිරට : එම පිඹුරේම ලොට් 127 සහ 128 ද, දකුණට : එම පිඹුරේම : ලොට් 120 ද, බටහිරට : එම පිඹුරේම ලොට් 45 (පාර) ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකක (පර්. 22) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේ ද වේ. (මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ T 75/76 හි ලියාපදිංචි කර ඇත.) පිඹුරු අංක 66/91 හි ලොට් 8, 13, 23, 24, 34, 45, 62, 94, 102, 103, 104, 145, 186, 188, 189 සහ 201 මාර්ග පරවශතා අයිතිය සමග වේ.

*ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය.
සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැණුම් මුදලින් 25% ක් එම ස්ථානයේදී ම ගෙවිය යුතුය.
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව අධිකරණයේ තැන්පත් කළ යුතුය.
03. රජයේ ගාස්තු සහ අනෙකුත් ගාස්තු ගෙවිය යුතුය.

ඊ. ඒ. සුලෝචනා එදිරිසිංහ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කුලියාපිටිය.

10-163

**තෙල්දෙණිය දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

සංශෝධිත පරිදි වූ 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සහ ඊට අනුකූලව නෛසයි තීන්දු ප්‍රකාශයක් සහ නියත තීන්දු ප්‍රකාශයක් ඉල්ලීම පිළිබඳ කාරණයේ දී ය.

නඩු අංකය : DDR/617/2019
තෙල්දෙණිය දිසා අධිකරණ ඇස්කිසි අංකය : 63/2025

පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී,
අංක 21, නවම් මාවත, කොළඹ 02.

*සහ දැනට,*

අංක 361, 361/1, ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 03.

*...............පැමිණිලිකරු.*

*- එදිරිව -*

(01) ස්ටාර්ගෝ (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 06, ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල,
හැඳල පාර, වත්තල.

(02) පත්මනාදන් ධර්ෂන්,
අංක 06, ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල,
හැඳල පාර, කෙරවලපිටිය, වත්තල.

(03) මුත්තයියා පත්මනාදන්,
අංක 06, ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල,
හැඳල පාර, කෙරවලපිටිය, වත්තල.

*නව ලිපිනය :*

අංක 42/3, දිගන පාර,
තේක්කවත්ත, කුණ්ඩසාලේ.

*.............විත්තිකරුවන්.*

වර්ෂ 2019ක් වූ සැප්තැම්බර් මස 25 දින කොළඹ දිසා විනිසුරු තැන්පත් ගරු චමත් මදනායක මැතිතුමා ඉදිරිපිට මෙම නඩුව සුදුස්සක් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන පැමිණිල්ල සහ ලේඛන කියවා බැලීමෙන් ද ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශයේ අඩංගු සම්ප්‍රකාශ ගැන සෑහීමට පත්වීමෙන් ද පසු ආඥාකර තීන්දු ප්‍රකාශ කරන වග නම්, රු. 1,234,960.55 ක මුදලක් සහ 2018.10.31 වැනි දින සිට මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් රු. 1,097,471.65 ක හිඟ ප්‍රාග්ධන මුදල මත වර්ෂයකට 29% බැගින් වූ වාර්ෂික පොලිය ද සමඟ විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට තීන්දු කර ඇති බැවින්,

ඉහත නම් සඳහන් විත්තිකරුවන්ගේ ගෙවල්, ඉඩම්, භාණ්ඩ, ණය සහ අයවිය යුතු ණය තහනමට ගෙන අවශ්‍ය නම් ඒවා විකිණීමෙන් අධිකරණයේ මේ තීන්දු ප්‍රකාශය මගින් විත්තිකරුවන්ට විරුද්ධව පැමිණිලිකරු විසින් අයකර ගෙන ඇති මුදල ලබා ගන්නා ලෙසට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

එකී තීන්දුව ඉටුකිරීමට තුන්වන විත්තිකරු විසින් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ දිසා අධිකරණ නඩු අංක DDR/617/2019 දරන නඩුව යටතේ තුන්වන විත්තිකරුට එරෙහිව නිකුත් කර ඇති ඇස්කිසිය ප්‍රකාරව, තෙල්දෙණිය දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් ඒ. ඒ. එම්. ඩී. ඩී. අමරසිංහ වන මා විසින් වර්ෂ 2025ක් වූ සැප්තැම්බර් මස 12 දින නිසිලෙස තහනම් කරන ලද තුන්වන විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2025 ක් වූ නොවැම්බර් මස 21 වැනි දින ප. ව. 3.30 ට,**

එකී නිශ්චල දේපළ පිහිටා ඇති කුණ්ඩසාලේ, දිගන පාර, තේක්කවත්ත යන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරුවන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ අයකිරීම් ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල 75%ක මුදල දින 30ක් ඇතුළත කොළඹ, දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩගම්පහ කෝරළයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 161 විදුරගේවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුණ්ඩසාලේ, විදුරගේවත්ත ගමෙහි පිහිටි (තල්වත්ත එස්ටේට් දැනට තේක්කවත්ත නමින් හඳුන්වන) නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. බී. ඩී. වැත්තෑව විසින් මැන සාදන ලද 1998.02.09 දිනැති අංක 2387 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 05 සඳහා මායිම් : උතුරට : කැබලි අංක 11 සහ 04 ද, නැගෙනහිරට : පූජ්‍ය රත්නායක සහ තවත් අය හිමිකම් කියන ඉඩම සහ කැබලි අංක 08 ද, දකුණට : කැබලි අංක 08 සහ 11 ද, බස්නාහිරට : කැබලි අංක 06 ද යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහ (පර්. 11) ක් *හෙවත්* හෙක්ටයාර 0.0278 ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ආදී සෑම සියළු දේ ද වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 748/198 හි ලියාපදිංචි කර ඇත. ඉහත ඉඩම සඳහා පිඹුරු අංක 2387 හි සඳහන් කැබලි අංක 11 මතින් මාර්ග අයිතිය ද සමඟ වේ.

*දේපළට පිවිසීම.-*

මහනුවර සිට හේවාහැට මාර්ගයේ කි. මී. 05ක් පමණ යන විට හමුවන තැන්නකුඹුර නගරයේ සිට මහියංගනය මාර්ගය ඔස්සේ කි. මී. 1.6ක් පමණ යන විට මාර්ගයේ දකුණු පසට හමුවන සන්රයිස් සුපිරි වෙළඳසැල සහ සිංගර් ප්‍රදර්ශනාගාරය අසලින් ඇති තේක්ක වත්ත පාරට පිවිස ඉදිරියට යන විට වම් පසට හමුවන අවසාන හිස් බිම් කොටස වේ.

ඒ. ඒ. එම්. ඩී. ඩී. අමරසිංහ,
අධිකරණ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
තෙල්දෙණිය.

වර්ෂ 2025 ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින,
තෙල්දෙණිය දිසා අධිකරණයේ දී ය.

10-238

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.